// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2456/06 - 2025 සැප්තැම්බර් මස 29 වැනි සඳුදා - 2025.09.29
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. -බී. 3/2021(III)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 26 වන වගන්තිය යටතේ වූ දැන්වීම

2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 26 වන වගන්තිය ප්‍රකාරව සහ පහත දක්වා ඇති උපලේඛනයේ නිශ්චිතව විස්තර දක්වා ඇති බලයලත් තැනැත්තා විසින් කරන ලද ඉල්ලීමට අනුව, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින්, එකී බලයලත් තැනැත්තා වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ සහ බලයලත් තැනැත්තන්ගේ ලියාපදිංචි ලේඛනයෙන් එහි නම ඉවත් කිරීමේ සිය අභිප්‍රාය පිළිබඳ දැන්වීම මෙයින් ලබා දී සිටිනු ලැබේ.

මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසු එකී බලයලත් තැනැත්තා වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කර බලයලත් තැනැත්තන්ගේ ලියාපදිංචි ලේඛනයෙන් එහි නම ඉවත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබන බවත් එසේ කටයුතු නොකළ යුතු වන්නේ නම් කාලසීමාව ඉකුත් වීමට පෙර එසේ නොකළ යුතු වීමට හේතු දැක්වීමට යම් තැනැත්තකුට හැකි බවත් දැන්වීම මගින් වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

**රෙවාන් වික්‍රමසූරිය,**
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
අධ්‍යක්ෂ ජනරාල්.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *බලයලත් තැනැත්තාගේ නම* | *බලපත්‍ර අංකය* | *බලපත්‍ර කාණ්ඩය* | *ලියාපදිංචි අංකය* | *නිකුත් කළ දිනය* |
|---|---|---|---|---|
| අමානා තකාෆුල් ලයිෆ් පීඑල්සී | 2310190020 | බලයලත් තැනැත්තා | පීසීසී 00289542 | 2023/12/01 |

EOG 09 - 0251